9. ලාංකේය සාම්ප්‍රදායික අවාචික සන්නිවේදන
රටාවල වෙසෙසියාව 147-166
ස්වර්ණා ඉහළගම

10. සිංහබාහු නාට්‍යයෙන් ප්‍රතිබිම්බනය වන
ගැඹුරු ජීවනාර්ථ පිළිබඳ විමර්ශනයක් 167-175
චින්තා පවිත්‍රානි

11. පැරණි ලක්දිව ආගමික පසුබිම පිළිබඳ සද්ධර්මාලංකාරය
ආශ්‍රිත අධ්‍යයනයක් 176-196
එච්. ඒ. ගිහාන් මධුසංඛ

12. භාෂා පරිවර්තනය පිළිබඳ ඇලෙක්සැණ්ඩර්
ෆ්‍රාසර් ටයිට්ලර් සංකල්පය 197-205
ජයමල් ද සිල්වා

13. **The Influence of Harps on Veena engravings
in Pitalkora Buddhist Cave Temple** 2 0 6 -
214
J. Chandana Ruwan Kumara

14. ඡන්දස 215-234
පූජ්‍ය බලදොර ඉන්දජෝති හිමි

15. **The Significant Moral Values of Proverbs
In Sanskrit Allegories** 235-251
Ven. Walapane Gnanasena Thero

16. සප්ත මාතෘ දේව වන්දනය 252-270
මංගලිකා ජයතුංග



# විනය ඇසුරෙන් පෝෂිත සිංහල ව්‍යාඛ්‍යාන සාහිත්‍යය

**පූජ්‍ය ඔක්කම්පිටියේ පඤ්ඤාසාර හිමි**

It is well known that the origins of Sinhala Literature which was inspired by Buddhism goes back to the arrival of Rev: Mahinda to Sri Lanka in the Third Century B. C.
There are a large number of commentary works on the "Vinaya Pitakaya" which is one part of the "Tripitaka" or the Buddhist canon.
The aim of this paper is to present an analytical study of this commentary literature on the "Vinaya Pitaka" After a preliminary introduction to the "Vinaya Pitaka" an attempt will be made to analyze how this commentary literature developed until the end of The "Dambadeniya Period."

ක්‍රි. පූ. 3 වන සියවසේ සිදු වූ මහින්දාගමනයත් සමග බුදුදහම ඇසුරින් සිංහල සාහිත්‍යයේ ආරම්භය සිදු වූ බව ප්‍රකට කරුණකි. ත්‍රිපිටකයේ ඒකදේශයක් වන විනය පිටකය හා සම්බන්ධ සිංහල ව්‍යාඛ්‍යාන සාහිත්‍ය කෘති රැසක් පවතී. විද්‍යාමාන හා අවිද්‍යමාන එම ව්‍යාඛ්‍යාන විනය සාහිත්‍ය කෘති පිළිබඳ විග්‍රහයක් කිරීම මෙම ලිපියේ මුඛ්‍යාර්ථය වෙයි. මෙහි දී විනය පිටකය පිළිබඳ මූලික විග්‍රහයක් කොට දඹදෙණි යුගයේ අවසානය තෙක් සිංහල ව්‍යාඛ්‍යාන විනය සාහිත්‍යය සංවර්ධනය වූ අන්දම විග්‍රහ කෙරේ.

බුද්ධ ශාසනය පර්යාප්ති, ප්‍රතිපත්ති හා ප්‍රතිවේධ වශයෙන් ත්‍රිවිධ වෙයි. එයින් පර්යාප්ති ශාසනය යනුවෙන් හඳුන්වන්නේ සූත්‍ර, විනය හා අභිධර්මය ත්‍රිපිටක බුද්ධ වචනයයි. සම්බුද්ධ පරිනිර්වාණයෙන් තුන් මසක් ගිය කල ප්‍රථම ධර්ම සංගායනාව

© **ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය ඔක්කම්පිටියේ පඤ්ඤාසාර හිමි**
සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු
**මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 23 කලාපය, 2014/2015**
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

පවත්වන ලද අතර එහි දී සංගීති කාරක මහරහතන් වහන්සේලා ධර්මය හා විනය සංගායනා කිරීමට කතිකා කරගත්හ.[1] ධර්ම කොටසට දීඝනිකායාදි නිකාය ග්‍රන්ථ ඇතුළත් සූත්‍ර පිටකය හා පට්ඨානප්පකරණය ආදි ග්‍රන්ථ ඇතුළත් අභිධර්ම පිටකය අයත් වන අතර විනය පිටකයට පාරාජිකා පාළි, පාචිත්තිය පාළි, මහාවග්ග පාළි, චුල්ලවග්ග පාළි, පරිවාර පාළි යන කෘති ඇතුළත් වෙයි. මෙම ත්‍රිපිටක බුද්ධ වචනය වෙනත් විවිධ නම්වලින් ද හඳුන්වනු ලබයි.

1. සූත්‍රපිටකය - ව්‍යාවහාර දේශනා
2. අභිධර්ම පිටකය - පරමාර්ථ දේශනා
3. විනය පිටකය - යථාපරාධ දේශනා වශයෙනි.

ප්‍රථම සංගායනාවේ දී විනය පිටකය ප්‍රථමයෙන් ම සංගායනා කරන ලදි. ශාසනයේ පැවැත්මට විනය ප්‍රධාන වන බැවින් එය සිදු කළ බව පෙනේ.[2]

විනය යන වචනයෙහි නිෂ්පත්තිය පිළිබඳ උගත්තු විවිධ අදහස් දක්වති. විවිධ, විශේෂාර්ථවාචී 'වි' උපසර්ගයත් ක්‍රමවාචී නය ශබ්දයත් (වි+නය) සමාස ව විනය යන වචනය සංසිද්ධ වූ බව හෝ 'වි' පූර්ව 'නි' ධාතුවෙන් සිද්ධ වූ වචනයක් විය හැකි බව හෝ මොරටුවේ සාසනරතන හිමියෝ පවසති.[3] එබැවින් විනය යන වචනයෙහි විවිධ වූ, විශේෂ ක්‍රම ඇති, යන අර්ථය හෝ කය වචන දෙකෙහි හික්මවීම යන අර්ථය හෝ අන්තර්ගත වන බව තව දුරටත් උන්වහන්සේ දක්වති.[4]

බුදුරජාණන් වහන්සේ විනය ශබ්දයේ අර්ථ දක්වා ඇත්තේ රාග, දෝෂ, මෝහ යන අකුසලයන් විනාශ කිරීම, දුරු කිරීම යන අර්ථයෙනි.

බුද්ධත්වයෙන් අවුරුදු 20ක් හෙවත් ප්‍රථම සම්බෝධිය තෙක් සංඝ සමාජය සඳහා විනය ශික්ෂාවන් පැනවීමක් සිද්ධ නොවීය. ආරම්භයේ දී සඟ සසුනට ඇතුළත් වූවෝ නිර්වාණය ම පරමාර්ථ කොට ගෙන සිටියහ. භික්ෂූන් සඳහා බුදුරජාණන් වහන්සේ විසින් නිරත ම උපදෙස් දෙනු ලැබූයේ ධම්මය ම ප්‍රමාණ කොට එය ම චරියාව කොට ගෙන ජීවත් විය යුතු බවයි.[5]



එහෙත් කල් යත් ම භික්ෂූන්වහන්සේලාගේ පැවැත්ම යහපත් නොවීය. ඒ නිසා ම බුදුරජාණන් වහන්සේට සංඝ ශාසනයේ පැවැත්මත් භික්ෂූන්ගේ පාරිශුද්ධත්වයත් උදෙසා විනය ශික්ෂාවන් පනවන්නට සිදු විය. බුද්ධත්වයෙන් ප්‍රථම විසිවස තුළ භික්ෂූන්ට ශික්ෂා පද නො පැන වූ බුදුන් වහන්සේ ඔවුනට ඕවාද ප්‍රාතිමෝක්ෂය දෙසූහ. ප්‍රාතිමෝක්ෂය, ඕවාද ප්‍රාතිමෝක්ෂය හා ආණා ප්‍රාතිමෝක්ෂය වශයෙන් දෙවැදෑරුම් ය. ඕවාද ප්‍රාතිමෝක්ෂය යනු භික්ෂු ජීවිතය පිළිබඳ හරය අන්තර්ගත දේශනාවකි. මුල් විසිවස තුළ භික්ෂු විනය සම්බන්ධයෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කළේ පහත සඳහන් ගාථාවන් පමණි.[6]

ඛන්තී පරමං තපෝතිතික්ඛා
නිබ්බාණං පරමං වදන්ති බුද්ධා
නහි පබ්බජිතෝ පරූපඝාතී
සමණෝ හෝති පරං විහෙඨයන්තෝ

ඉවසීම උතුම් වූ තපස් ගුණයකි. බුදුවරයෝ නිවන උසස් කොට දේශනා කරති. මෙරමා නසන්නා පැවිද්දෙක් නොවේ ම ය. මෙරමා වෙහෙසනුයේ මහණෙක් නොවේ ම ය.

සබ්බපාපස්ස අකරණං
කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියෝදපනං
ඒතං බුද්ධානසාසනං

සියලු ම පව් නොකිරීම, කුසල් වැඩීම, සිත පිරිසිදු කර ගැනීම යන මේවා සියලු බුදුරජාණන් වහන්සේලාගේ අනුශාසනා වෙයි.

අනූපවාදෝ අනූපඝාතො - පාතිමොක්ඛෙ ච සංවරො
මත්තඤ්ඤුතා ච භත්තස්මිං - පන්තඤ්ච සයනාසනං
අධිචිත්තෙ ච ආයෝගෝ - ඒතං බුද්ධානසාසනං

අනුන් හෙළා තළා කථා නොකිරීම, අනුන්ට ගර්හා නොකිරීම, ප්‍රාතිමෝක්ෂ සංවරයෙහි පිහිටීම, ආහාරයෙහි පමණ දැන ගැනීම, ගමෙන් ඈත පිහිටි සේනාසනයෙහි ඇලීම, සමවත් ව වැඩීම, සියලු බුදුවරයන් වහන්සේලාගේ අනුශාසනාවෝ වෙති.

ආණා ප්‍රාතිමෝක්ෂය යනු භික්ෂු භික්ෂුණීන් වැරදි මාර්ගයෙන් මුදවාගෙන ඔවුන් නිර්වාණගාමී ප්‍රතිපදාවේ යහපත හා ශාසනයේ පැවැත්ම සඳහා පනවන ලද ශික්ෂාපදයි. එම ශික්ෂාපද භික්ෂු භික්ෂුණීන් විනා බුදුවරු නොම උදෙසති; හෙවත් භික්ෂුභික්ෂුණීන් අඩමසක් පාසා උදෙසිය යුතු ශික්ෂා ආණා ප්‍රාතිමෝක්ෂය වෙයි. විනය පිටකය ග්‍රන්ථ 5කින් සමන්විත වෙයි.

1. පාරාජිකා පාළි
2. පාචිත්තිය පාළි
3. මහාවග්ග පාළි
4. චුල්ලවග්ග පාළි
5. පරිවාර පාළි

මෙම කෘති 5ට මූලාශ්‍රය වුයේ ප්‍රාතිමෝක්ෂය නම් විනය ග්‍රන්ථයයි. එය ත්‍රිපිටකයට අයත් කෘතියක් නොවේ. එහි අන්තතර්ගත වන්නේ භික්ෂුභික්ෂුණී විනය සම්බන්ධයෙන් පනවන ලද ශික්ෂාවන් ය. ඒවා හුදෙක් විනය ප්‍රඥප්තීන් පමණි; හෙවත් මාතෘකාවන් පමණි. මාතිකා නමින් හඳුන්වන්නේ ද ඒ නිසා ය. එම ශික්ෂාපද මාතෘකා (මාතිකා) විවරණය කරමින් විනය පිටකයට අයත් පාරාජිකාපාළි ආදී අනෙකුත් විනය පිටකය සම්පාදනය විය. ප්‍රාතිමෝක්ෂයේ අන්තර්ගත ශික්ෂාවන් විවරණය කරමින් විනය පිටකයට අයත් ග්‍රන්ථ සම්පාදනය වී ඇති හෙයින් එක ම ශික්ෂාවක් දෙවරක් නියෝජනය වීම වැළැක්වීම සඳහා ප්‍රාතිමෝක්ෂය විනය පිටකයට අයත් කෘතීන්ගෙන් බැහැර විය. ආරම්භයේ දී විනය ශික්ෂාවන් මාතිකා හෙවත් මාතෘකා වශයෙන් පැවැති අතර ඒ නිසා ඒවා කටපාඩමෙන් පවත්වා ගෙන ඒමට ද හැකි විය. පසු කාලයේ දී ඒවා විවරණය කිරීම නිසා විනය පිටකය සකස් වූ බව පෙනේ. ඉහත සඳහන් විනය පිටකයට අයත් පාරජිකා පාළි හා පාචිත්තිය පාළි යන කෘති විභංග නමින් හඳුන්වනු ලබයි.



| | |
|---|---|
| පාරාජිකා පාළි<br>පාචිත්තිය පාළි | } විභංග |

මහාවග්ග හා චුල්ලවග්ග පාළි යන කෘති ද්වය ඛන්ධක නමින් හැඳින්වෙයි.

| | |
|---|---|
| මහාවග්ග පාළි<br>චුල්ලවග්ග පාළි | } ඛන්ධක |

විභංග හා ඛන්ධකයන්හි ඇති විනය ශික්ෂාවන් සොළොස් වැදෑරුම් වූ පරිවාරයකින් යුක්ත වන බැවින් විනය පිටකයේ අවසන් කෘතිය පරිවාර පාළිය නමින් හඳුන්වනු ලබයි.

විභංග, ඛන්ධක හා පරිවාර යන විනය පිටකයට, **සමන්ත පාසාදිකා** නම් විනය අටුවාවත්, භික්ෂු භික්ෂුණී ප්‍රාතිමෝක්ෂයට **කංඛාවිතරණීමාතිකට්ඨ කථාවත්** බුද්ධඝෝස හිමියන් විසින් සම්පාදනය කෙරිණි. මෙම විනය අටුවා ද්වයෙන් කංඛාවිතරණී මාතිතට්ඨකථාව පළමුවෙන් සම්පාදනය කළ කෘතිය ලෙස පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝ පවසති.[7] **කංඛාවිතරණීමාතිකට්ඨ** කථාව සීහල අට්ඨකථා ඇසුරු කරමින් සම්පාදනය කළ බව එහි සඳහන් ව තිබීමත් සමන්තපාසාදිකාව පිළිබඳ සඳහන් ව නොතිබීමත් එයට හේතු වශයෙන් තවදුරටත් උන්වහන්සේ දක්වති. බුද්ධඝෝස හිමියන් විසින් සම්පාදිත සමන්තපාසාදිකා විනය අටුවාව ගද්‍ය කෘතියක් වන අතර එම ගුරුපරපුරට සම්බන්ධ බුද්ධදත්ත හිමියන් විසින් රචිත **විනය විනිච්ඡය** පද්‍යමය කෘතියකි.

විනය පිටකය හා සම්බන්ධ පාලි පොත පත හා ඒවා සම්බන්ධ සිංහල ව්‍යාඛ්‍යාන කෘති සම්පාදනය කිරීමට ලාංකික භික්ෂූන් වහන්සේ විශේෂ උනන්දුවක් දැක් වූ බව පෙනේ. සමහර විට එයට හේතුව ලාංකික භික්ෂු පරපුර විනය පිටකය භාර ව කටයුතු කළ උපාලි මහරහතන් වහන්සේගෙන් පැවැත එන භික්ෂු පරපුරක් වීම නිසා විය යුතු ය.

විනය හා සම්බන්ධ මෙම ආචාර්ය පරම්පරාව පිළිබඳ සමන්තපාසාදිකාවේ අන්තර්ගත වෙයි[8][8]

ඉන් උපාලි, දාසක, සෝණක, සිග්ගව, මොග්ගලීපුත්තතිස්ස, මහා මහින්ද යන මහරහතන් වහන්සේලා ඉන්දියානු භික්ෂූන් වහන්සේ වන අතර අරිට්ඨ, තිස්ස දත්ත, කාල සුමන, දීඝ සුමන, දෙවන කාල සුමන, බුද්ධරක්ඛිත, තිස්ස, දේව, සුමන, චූළනාග ධම්මපාලිත රෝහණ, ඛේම, උපතිස්ස ඵුස්සදේව, (දෙවන) සුමන, ඵුස්ස, මහාසිව (දෙවන) තිස්ස (දෙවන) ඵුස්ස, චූලාභය (තෙවන) තිස්ස, (දෙවන) ඵුස්සදේව හා සිව යන තෙරවරු ලාංකික භික්ෂූහු වෙති. මේ නිසා විනය පිටකයේ ආරක්ෂාව සඳහා ලාංකික භික්ෂූන් වහන්සේලාට විශේෂ වගකීමක් පැවැති බව පෙනේ. එබැවින් බොහෝ භික්ෂූන් වහන්සේලා විනය පිටකය ආශ්‍රය කරමින් පාළි විනය ග්‍රන්ථ හා විනයට්ඨ කථා ග්‍රන්ථ ඇසුරු කරමින් සිංහල ව්‍යාඛ්‍යාන ග්‍රන්ථ රැසක් සම්පාදනය කොට ඇත.

බුද්ධඝෝස, බුද්ධදත්ත ආදි අටුවාචාරීන් වහන්සේලාගේ විනය අටුවාවලට පසු ව පාරාජිකා පාළි, පාචිත්තිය පාළි මහාවග්ග පාළි හා චුල්ලවග්ග පාළි යන විනය ග්‍රන්ථයන්හි සාරය කැටි කොට **බුද්දසික්ඛා**, නම් විනය ග්‍රන්ථයක් ධම්මසිරි නැමැති හිමිනමක විසින් රචනා කොට ඇත. නිකාය සංග්‍රහයේ සඳහන් ලේඛක නාමාවලියේ 'ධම්මසිරි' නම් හිමි නමක පිළිබඳ සඳහන් වන අතර බුද්දසික්ඛාවෙහි කතුවරයා ඉහත සඳහන් හිමියන් ලෙස සැලකිය හැකි ය. මෙය පද්‍යයෙන් සම්පාදිත කෘතියක් වන අතර මේ කෘතිය පිළිබඳ පොළොන්නරු[9] දඹදෙණි[10] කතිකාවත්හි සඳහන් වීමෙන් පෙනීයන්නේ මෙය උසස් කෘතියක් ලෙස එවක පිළිගැනුණු බවයි. උපසපන් භික්ෂුවක විසින් මූලික වශයෙන් දැන ගත යුතු විනය ශික්ෂාවන් මෙහි සංග්‍රහ කොට ඇත. මෙහි ගාථා 500ක් ඇතැයි සඳහන් වෙතත් එහි ඇත්තේ ගාථා 463 ක් පමණි. ගද්‍ය පාඨ ද රැසක් ම ඇති බැවින් ඒවා සමග ගණනය කළ යුතු වෙයි.

මෙම බුද්දසික්ඛා කෘතියට කුදුසික පදාර්ථ නම් සන්න කෘතිය දඹදෙණි යුගයේ දී රචනා වී ඇති අතර එහි කතුවරයා නිශ්චිත ව



කිව නොහැකි ය. මෙම කුදුසික පදාර්ථ සන්න කෘතියට ආශ්‍රය වූ පැරැණි කුදුසික පුරාතන සන්නයක් පැවැති බව ද සඳහන් වෙයි.[11] ඒ අනුව බුද්දසික්ඛා නම් පාලි කෘතියට සිංහලයෙන් ව්‍යාඛ්‍යාන ග්‍රන්ථ දෙකක් පැවැති බව පෙනේ.

1. කුදුසික පුරාතන සන්නය (අවිද්‍යමාන)
2. කුදුසික පදාර්ථ වර්ණනා (විද්‍යමාන)

මෙම කෘතිය **කුදුසික හා පුරාතන විස්තර සන්නය** නමින් මොරගොල්ලේ සිරි ඤාණොභාසතිස්ස හිමි (1954) හා **කුදුසික සන්නය** නමින් වැලිගම ඤාණරතන හිමියන් විසින් සකස් කොට ඇත. බුද්ධඝෝෂ හිමියන් විසින් භික්ෂු භික්ෂුණී ප්‍රාතිමෝක්ෂයට කඞ්ඛාවිතරණීමාතිකට්ඨ කථා නම් කෘතියක් සම්පාදනය කරන ලද බව ඉහතින් දැක්විණි. විනය ශික්ෂාවන් සම්බන්ධ සැකමුසු තැන් දුරුකරමින් ශික්ෂා මාතෘකා පිළිබඳ කරන ලද අට්ඨකථාවක් බැවින් එය කඞ්ඛාවිතරණීමාතිකට්ඨ කථාව නමින් හැඳින්විණ. මෙම කඞ්ඛාවිතරණීමාතිකට්ඨ කථාව පැරැණි සිංහල අට්ඨකථාවක් ඇසුරෙන් සම්පාදනය වූවක් බව ග්‍රන්ථාවසානයේ එන ගාථා පාඨයකින් හෙළිවෙයි.[12]

කඞ්ඛාවිතරණීමාතිකට්ඨ කථාවට ලියන ලද හෙළ කඞ්ඛාවිතරණී ගැටපදයක් පැවැති බව කුදුසික සන්නයේ සඳහන් වෙයි.[13]

එසේ ම දඹදෙණි යුගයේ පාළි කඞ්ඛාවිතරණී පිටපොතක් ද සම්පාදනය වී ඇති අතර එහි ද හෙළ කඞ්ඛාවිතරණී ගැටපදයක් ගැන තොරතුරු සඳහන් වෙයි.[14] එසේ ම කඞ්ඛාවිතරණී සන්නයක්[15] ගැන ද හෙළු කඞ්ඛාවිතරණියක් ගැන ද කඞ්ඛාවිතරණී පිටපොතෙහි සඳහන් වෙයි.[16]

මේ අනුව පාලි කඞ්ඛාවිතරණී මාතිකට්ඨකථාවට සම්බන්ධ සිංහල පොත් කීපයක් පිළිබඳ තොරතුරු අපට හමුවෙයි.

1. කඞ්ඛාවිතරණීමාතිකට්ඨ කථාවට පදනම් වූ සීහලට්ඨකථාවක් පැවැති බව සඳහන් වීම (අවිද්‍යමාන)
2. හෙළ කඞ්ඛාවිතරණී ගැටපදය (අවිද්‍යමාන)
3. කඞ්ඛාවිතරණී සන්නය (අවිද්‍යමාන)
4. හෙළ කඞ්ඛාවිතරණීය (අවිද්‍යමාන)
5. කඞ්ඛාවිතරණී පිටපොත (විද්‍යමාන)

අනුරාධපුර යුගයේ දී මූලසික්ඛා නම් තවත් පාලි විනය ග්‍රන්ථයක් සම්පාදන වී ඇති අතර එහි කතුවරයා 'මහා ස්වාමි' පදවිය දැරූ යතිවරයෙකි. මෙය ගාථා 126කින් පරිමිත වූවක් වන අතර උපසපන් භික්ෂුවක විසින් දත යුතු මූලික විනය ශික්ෂාවන් පමණක් මෙහි අන්තර්ගත ය. සිඛවළඳ හා සිඛ වළඳ විනිසෙහි අවසානයේ එන විස්තරයට අනුව මුලසික්ඛාවත් සිඛවළඳ හා සිඛ වළඳ විනිසත් එක ම කර්තෘ කෙනෙකුගේ බව පෙනේ.[17] මෙම මුලසික්ඛාවෙහි පරිවර්තනයක් ලෙස සිඛවළඳ සම්පාදනය වී ඇති අතර සිඛවළඳ විනිස, සිඛවළඳෙහි අටුවාව වෙයි. සිඛවළඳත් සිඛවළඳ විනිසත් එක ම කෘතියක් ලෙස විද්වතුන් විසින් පිළිගනු ලබයි. මූලසික්ඛාවත් සිඛවළඳ හා එම විනිසත් පොළොන්නරු කතිකාවත සම්පාදනය වීමට පෙරාතුව රචනා වූ ඒවා බව එම කතිකාවතෙහි සඳහන් ව තිබීමෙන් පෙනීයයි. ඊට අමතර ව සිඛවළඳ පිටපොත නමින් තවත් කෘතියක් ද සම්පාදනය කොට ඇති අතර එය පොළොන්නරු යුගයට අයත් කෘතියක් ලෙස සැලකේ.

සිඛවළඳ පඤ්චමූල පරිවේණාධිපති නම් හිමි නමක විසින් සික්ඛාපද වලඤ්ජන නමින් පාලියට පරිවර්තනය කරනු ලැබ ඇත. ඒ අනුව මූලසික්ඛාවෙහි පරිවාර ග්‍රන්ථ ලෙස පහත සඳහන් කෘති දැක්විය හැකි ය.

මූලසික්ඛා (පාලි)
සිඛවළඳ හා වළඳ විනිස (සිංහල)
සිඛවළඳ විනිස පිටපොත (සිංහල)
සික්ඛාපද වලඤ්ජනය (පාලි)

අටුවාචාරී බුද්ධදත්ත හිමියන් විසින් අනුරපුර යුගයේ දී විනය පිටකය අළලා විනය විනිච්ඡය නම් කෘතියක් සම්පාදනය කරනු ලැබ



ඇත. පාලි ගාථා 3183න් පරිමිත එයට 'වන විනිස' සන්නය නමින් ව්‍යාඛ්‍යාන කෘතියක් රචනා වී ඇත. එහි කතුවරයා දෙවන පණ්ඩිත පැරකුම්බාවන් ලෙස සැලකේ. එම රජු විසින් රචිත විශුද්ධි මාර්ග සන්නයෙහි 'විස්තරාර්ථීන් විසින් වන විනිසට ලියූ නිස්සන්දේහ සන්නය බලා දත යුතු' යන පාඨයක් දක්නට ඇත.[18] ඒ අනුව මෙම කෘතියට නිස්සන්දේහ යන නම භාවිත කළ බවත් එය 2 පැරකුම් රජුගේ කෘතියක් බවත් පෙනේ. මෙම කෘතිය අද දක්නට නැත. එහෙත් මෙබඳු කෘතියක් පිළිබඳ කඞ්ඛාවිතරණී පිටපොතෙහි සඳහන් වෙයි.[19]

සිඛවළඳ විනිසෙහි දුරවබෝධ පද විවරණය කරමින් සිඛවළඳ විනිස පිටපොත රචනා කොට ඇති අතර එහි කතුවරයා නිශ්චිත ව කිව නොහැකි ය. සිඛවළඳ විනිස පිළිබඳ පොළොන්නරු කතිකාවතෙහි ද සඳහන් වන අතර එවක පැවැති අවශ්‍යතාවකට අනුව සිඛවළඳ විනිසෙහි දුරවබෝධ පද විමර්ශනය කරමින් මෙම කෘතිය රචනා කොට ඇත. ඒ අනුව මෙහි කතුවරයා නිකාය සංග්‍රහයේ සඳහන් ව්‍යාඛ්‍යාන කර්තෘවරුන්ගෙන් කෙනෙකු විය හැකි ය. සිවලිංග වන්දනාව ගැන සඳහන් වීමෙන් ද දෙමළ වචන කීප පළක ම සඳහන් ව තිබීම හා සකු මුසු බස්වහර හමුවීම නිසා ද මෙම කෘතිය පොළොන්නරු යුගයේ දී හෝ ඒ ආසන්න කාලයක දී ලියවෙන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.[20]

විනය පිටකයේ අවසන් කෘතිය වන පරිවාර පාළියට ලියන ලද සිංහල ව්‍යාඛ්‍යාන ග්‍රන්ථ පරිවාර ගණ්ඨි පදය නමින් හැඳින් වෙයි. මෙහි කතුවරයා පිළිබඳ කිසිදු සඳහනක් කෘතියෙහි දක්නට නැති අතර මෙහි අන්තර්ගත භාෂාවට අනුව පොළොන්නරු යුගයේ අවසානයේ හෝ දඹදෙණි යුගයේ ආරම්භයේ රචිත කෘතියක් ලෙස සැලකිය හැකි ය. මෙම පරිවාර ගණඨි පදයට අභිනව සංස්කරණයක් කළ වෙ. වි. අභය ගුණවර්ධන සූරීන් මෙම පරිවාර ගණ්ඨිපදයට ආශ්‍රය වූ පැරණි සිංහල ගණ්ඨිපදයක් පැවැති බව අදහස් කරයි.[21]

පරිවාර පාළි
පරිවාර ගණ්ඨිපදය (අවිද්‍යමාන)
පරිවාර ගණ්ඨිපදය (විද්‍යමාන)

මේ හැරුණු විට විනය පිටකය හා සම්බන්ධ තවත් සිංහල ගැටපද ග්‍රන්ථ තුනක් පිළිබඳ පොළොන්නරු යුගයේ වැඩ සිටි සාරිපුත්ත සංඝරාජ මාහිමියන් විසින් රචිත සාරත්ථදීපනී නම් විනය අටුවාවෙහි සඳහන් වෙයි.[22]

> මාහාගණ්ඨිපදේති වා මජ්ඣිම ගණ්ඨිපදේති වා චූල ගණ්ඨිපදේති වා වුත්තේ සීහළගණ්ඨිපදේසූති ගහෙ තබ්බං (මහා ගණ්ඨි පද, මජ්ඣිම ගණ්ඨි පද, චූළ ගණ්ඨි පද යැයි කී කල්හි සිංහල ගැටපද ගත යුතු ය)

ඒ අනුව විනය පිටකය සඳහා මහා, මජ්ඣිම හා චූළ වශයෙන් සිංහල ගැටපද ග්‍රන්ථත්‍රයක් පැවැති බව පෙනේ.

**හෙරණ සිඛ හා හෙරණ සිඛ විනිස** නමින් තවත් සිංහල විනය කෘතියක් රචනා වී ඇති අතර එහි කතුවරයා කවරෙක් ද යන්න ස්ථිර ව කිව නොහැකි ය. පොළොන්නරු[23] හා දඹදෙණි[24] කතිකාවත්වල ද හෙරණ සිඛ පිළිබඳ සඳහන් වන බැවින් එම යුගයන්ට පෙර ලියන ලද බව පෙනේ. සාමණේර භික්ෂූන් සඳහා විනය ශික්ෂාවන් සංග්‍රහ කොට මෙය සම්පාදනය කොට ඇත. මෙහි දසසිල්, දසසිඛ, දසපරිජි, දසනාසනා, දසදඬුවම් ආදිය හා වත් සිරිත් රැසක් අන්තර්ගත ය. මෙම කෘතිය සම්පාදනය කිරීමේ දී චුල්ලවග්ග පාළිය හා වග්ග පාළිය බහුල කොට ඇසුරු කොට ඇති බව පෙනේ.

**විනය සත්‍යය** නම් කෘතිය ද දඹදෙණි යුගයේ දී ලියවුණකි. මෙහි කතුවරයා දිඹුලාගල මේධංකර නැමැති හිමි නමකි. මෙම කෘතිය '**විනය සන්නය, පෙසලමතිපිපහව විනයාර්ථ සමුච්චය**' යන නම්වලින් ද හඳුන්වනු ලැබ ඇත. මෙහි වන විනිස පිළිබඳ ව සඳහන් වන බැවින් ඊට පසු කාලීන ව ලියවුණු කෘතියක් ලෙස සැලකිය හැකි ය. කුදුසිඛ සන්නයෙහි හා කඞ්කාවිතරණී ගැටපදයෙහි මෙම කෘතිය පිළිබඳ සඳහන් වන බැවින් එම කෘතිවලට පෙරාතු ව රචනා වූ බව පෙනේ.[25]

**කැලි සත්‍යය** හෙවත් **කැලිපිටපොත** විනය ශික්ෂාවක් සම්බන්ධ ව රචිත තවත් ව්‍යාඛ්‍යානයකි. මෙය සමන්තපාසාදිකාවේ



විකාලභෝජන ශික්ෂාව හා සම්බන්ධ පද සමූහයකට අරුත් පැහැදිලි කිරීම් වශයෙන් රචිත කෘතියකි. මෙහි කතුවරයා හෝ රචිත යුගය ස්ථිර ව කිව නොහැකි වුව ද දඹදෙණි යුගයට අයත් විය හැකි බව විද්වත් අදහස වෙයි. කාලීන විනිශ්චයකට අදාළ කෙරුණු සංග්‍රහයක් බැවින් 'කාලීන' යන්න 'කැලි' යැයි හෙළ බසට නගා මෙයට නම් තබා ඇති බව සන්නස්ගල සූරීහු පවසති.[26]

මේ අන්දමට ලංකාවේ සිංහල විනය සාහිත්‍යය පෝෂණය කිරීමෙහිලා ලාංකික විද්වතුන්ගෙන් විශාල මෙහෙයක් සිදු වී ඇති බව පෙනේ. අනුරාධපුර යුගයේ සිට දඹදෙණි යුගය තෙක් සම්පාදිත විනය සාහිත්‍ය කෘති මේ සඳහා නිදසුන් ය. මේවා සියල්ල ම පාහේ ව්‍යාඛයාන ග්‍රන්ථ වීම විශේෂයකි.

01. කුදුසික පුරාතන සන්නය (අවිද්‍යමාන)
02. කුදුසික පදාර්ථ වර්ණනා (විද්‍යමාන)
03. කඞ්ඛාවිතරණීමාතිකට්ඨකථාවට පදනම් වූ සීහලට්ඨකථාව (අවිද්‍යමාන)
04. හෙළකඞ්ඛාවිතරණී ගැටපදය (අවිද්‍යමාන)
05. කඞ්ඛාවිතරණී සන්නය (අවිද්‍යමාන)
06. හෙළකඞ්ඛාවිතරණිය (අවිද්‍යාමාන)
07. කඞ්ඛාවිතරණී පිටපොත (විද්‍යමාන)
08. සිඛවළඳ හා සිඛවළඳ විනිස (විද්‍යමාන)
09. සිඛවළඳ විනිස පිටපොත (විද්‍යමාන)
    සික්ඛාපද වලඤ්ජනය (පාලි)
10. වනවිනිස සන්නය (නිස්සන්සෙහ සන්නය) (අවිද්‍යමාන)
11. පරිවාරගණ්ඨි පදය (අවිද්‍යමාන)
12. පරිවාරගණ්ඨි පදය (විද්‍යමාන)
13. මහාගණ්ඨි පදය (අවිද්‍යමාන)
14. මජ්ඣිමගණ්ඨි පද්‍ය (අවිද්‍යාමාන)
15. චූළගණ්ඨි පදය (අවිද්‍යාමාන)
16. හෙරණ සිඛ හා හෙරණසිඛ විනිස (විද්‍යමාන)
17. විනය සන්නය (අමුද්‍රිත)
18. කැලි සත්‍යය හෙවත් කැලි පිටපොත (විද්‍යමාන)

මේ හැරුණු විට තවදුරටත් සම්භාව්‍ය කෘති, කතිකාවත් හා ශිලාලිපි පරීක්ෂා කිරීමෙන් නෂ්ටප්‍රාය සිංහල විනය ව්‍යාඛ්‍යාන ග්‍රන්ථ රැසක් පිළිබඳ තොරතුරු සපයා ගත හැකි වෙයි.

**ආන්තික සටහන්:**

1. සමන්තපාසාදිකා (සංස්.) සිරි විසුද්ධි හිමි. කොස්ගොඩ, 1933, මයං රාජගහෙ වස්සං වසන්තා ධම්මඤ්ච සංගායාම. 35 පිටුව.
2. එම, විනයෝ නාම බුද්ධසාසනස්ස ආයුවිනයෙ ඨිතෙ සාසනං ඨිතං හෝති තස්මා පඨමං සංගායාම. 35 පිටුව.
3. සාසනරතන හිමි, මොරටුවේ, විනය කෝෂය, iv පිටුව.
4. එම, iv පිටුව.
5. මජ්ඣිම නිකාය, මූල පණ්ණාසකය. කකචූපම සූත්‍රය, බු. ජ. ත්‍රි ග්‍ර. 10 තස්මාතිහ භික්ඛවේ එවං සික්ඛිතබ්බං ධම්මං යෙව සක්කරොන්තෝ ධම්මං ගරුකරොන්තො ධම්මං අපචායමානො සුවචාභවිස්සාම සොවචස්සතං ආපජ්ජිස්සමාති එවං හි භික්ඛවේ සික්ඛිතබ්බං. 316 පිටුව.
6. දීඝනිකාය, මහාපදාන සූත්‍රය බු. ජ. ග්‍ර. මු. vii, 1976, 72 පිටුව
3. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය 1966. 210 පිටුව
4. සමන්තපාසාදිකා, සංස්, සිරි විසුද්ධි හිමි, කොස්ගොඩ, 1933
   උපාලි දාසකො චෙව - සොණකො සිග්ගවොතථා
   තිස්සෝ මොග්ගලීපුත්තො ච - පඤ්චේතේ විජිතාවිනො -පෙ-
   එතෙ නාගා මහා පඤ්ඤා - විනයඤ්ඤූමග්ගකෝවිදා
   විනයං දීපෙ පකාසේසුං - පිටකං තම්බපණ්ණියා.
5. සූරවීර, ඒ. වී. **සිංහල කතිකාවත් හා භික්ෂු සමාජය**, 1985, 98 පිටුව 'යැටත් පරිසෙයින් විනයෙන් කුදුසික හා පාමොක්ද සුගතති දස ධර්ම සූත්‍රය ද අනුමාන සූත්‍රය '
6. එම 112 පිටුව 'උභය ප්‍රාතිමොක්ෂ කුදුසිඛ අර්ථ සංග්‍රහය පරිහරණය කරන ව්‍යාකරණ සුතුරු'
7. **කුදුසික හා පුරාතන විස්තර සන්නය** (සංස්) සිරි ඤාණෝභාසතිස්ස හිමි, මොරගල්ලේ 1954, 71, 78, 93, 95 105, 107, 110, 132, 174 මෙම පිටු අංක **සාහිත්‍ය අටුවා දඹදෙණි සාහිත්‍යය** කර්තෘ සිරි තිලකසිරි මහතාගේ කෘතියෙන් ලබාගත් බව කෘතඥතා පූර්වක ව සඳහන් කරමි. මේ හැරුණු විට '**කුදුසික සන්නය**' නමින් තවත් සංස්කරණ දෙකක් වැලිගම ඤාණරතන හිමියන් විසින් සම්පාදිත ව ඇත.
8. **කඞ්ඛාවිතරණීමාතිකට්ඨකථාව**. සංස් ජිනරතන හිමි, කරඳන. 1930
   ආරභිං යමහං සබ්බං - සීහලට්ඨකථා නයං
   මහාවිහාරවාසීනං - වාචනාවග්ග නිස්සිතං
   නිස්සාය සා අයං නිට්ඨං - ගාථා ආදාය සබ්බසො
   සබ්බං අට්ඨකථාසාරං - පාලිඅත්ථං ච කෙවලං 204 පිටුව



9. කුදුසික හා පුරාණ විස්තර සන්නය. සංස්. සිරි ඤාණෝභාසතිස්ස හිමි. මොරගොල්ලේ, 1954, 150, 154 පිටු. (සාහිත්‍ය අටුවාව දඹදෙණි සාහිත්‍යය, සිරි තිලකසිරි)
10. කඞ්ඛාවිතරණීපිටපොත, සංස්, පඤ්ඤාසේඛර හිමි, කලුකොඳයාවේ 1963. හෙළු ගැටපදයෙහි ද නාම මත්තං යි ගෙණ මෙනම් ඇවැතැ යි අත්‍රී ගත්හු. 39 පිටුව.
11. එම. - කඞ්ඛාවිතරණීසන්‍යයෙහි එක් පක්ෂයක් කීහු 97 පිටුව. පාද නම් මගධ රටැහි ලාසුයෙහි ද නාම මත්තං යි ගෙණ මෙනම් ඇවැතැ යි අත්‍රී ගත්හු. 106 පිටුව.
12. එම. - සුචී - පන්හිද ය යනු හෙළු කඞ්ඛාවිතරණියි. 107 පිටු.
13. සිඛ වළඳ හා සිඛ වළඳ විනිස. සංස්. විමලකීර්ති හිමි, මැදඋයන්ගොඩ, 1970 අටුවා පාඨ උපදෙස් බලා සැබෙවින් සුල්සිඛ හා සිඛවළඳ හා සිඛ වළඳ විනිස මා විසින් කරන ලද්දේ ය. ලිඛිත දොසක් ඇත එ පියා ලා හෙළා වරද නො කියා අටුවා පාඨ උපදෙස් බලා වනධරුන් හා සසැඳ ගත යුතු, 123 පිටුව.
14. විශුද්ධිමාර්ග සන්නය, සංස්ඃ ධම්මරතන ස්ථවීර, කුඹුරුපිටියේ බු. ව. 2468 ප්‍රථමභාගය, 3 පිටුව.
15. කඞ්ඛාවිතරණී පිටපොත සංස්ඃ පඤ්ඤාසේකර හිමි කලුකොඳයාවේ. 1936 ඉමං ගණහථයි නො ඉදුරා පැවරීනො ගෙණා තාක් කියා එළවූ යමකුදු වළකත් පැවරීම වෙයි යනු වන විනිස සන්‍යයි. 83 පිටුව.
16. ධම්මතිලක හිමි, ඔබේගොඩ, සිංහල විනය සාහිත්‍යය. 1922 77 පිටුව
17. පරිවාර ගණ්ඨිපදය. සංස් වෙ. වි. අභය ගුණවර්ධන, 199, ප්‍රස්තාවනාව xxxiv
18. සාරත්ථදීපනී විනය ටීකා, සංස්. දෙවරක්ඛිත හිමි. බු. ව. 2458. 7 පිටුව
19. සූරවීර ඒ. වී. සිංහල කතිකාවත් හා භික්ෂු සමාජය. හෙරණුණුදු හෙරණ සිඛි සෙඛියා දසධම් පුතන් වන පොත් කොටැ අසා නොපිරිහෙළා පරිහරණය කරනු කොට 99 පිටුව.
20. එම. හෙරණුන්ට හෙරණ සිඛ වනපොත් කොට නිම වන තුරු මහලු පැවිදි බණ වන පොත් කොට 111 පිටුව
21. සුමනජෝත් හිමි, දෙගම්මැද බු. ව. 2503 දඹදෙණි යුගය. 254 - 255 පිටු.
22. පුංචි බණ්ඩාර සන්නස්ගල, සිංහල සාහිත්‍ය වංශය. 1994 217 පිටුව

**ආශ්‍රිත ග්‍රන්ථඃ**

**ප්‍රාථමික මූලාශ්‍රයඃ**

**කඞ්කාවිතරණී පිටපොත**, කලුකොඳයාවේ පඤ්ඤාසේකර හිමි සංස්කරණය, 1936.

**කඞ්කාවිතරණීමාතිකට්ඨකථාව**, කරඳන ජිනරතන හිමි සංස්කරණය, 1930.

**කුදුසික සන්නය**, වැලිගම ඤාණරතන හිමි.

**කුදුසික හා පුරාතන විස්තර සන්නය**, මොරගොල්ලේ සිරි ඤාණෝභාසතිස්ස හිමි සංස්කරණය, 1954
**දීඝනිකාය.**
**පරාජිකා පාළි.**
**පරිවාර ගණ්ඨිපදය**, වෙ. වි. අභය ගුනවර්ධන සංස්කරණය, 199 (?).
**මජ්ඣිම නිකාය.**
**විශුද්ධිමාර්ග සන්නය**, කඹුරුපිටියේ ධම්මරතන ස්ථවිර සංස්කරණය, බු. ව. 2468.
**සමන්තපාසාදිකා**, කොස්ගොඩ සිරි විසුද්ධි හිමි සංස්කරණය, 1933.
**සාරත්ථදීපනී විනය ටීකා**, දේවරක්ඛිත හිමි සංස්කරණය, බු. ව. 2458.
**සිඛ වළඳ හා සිඛ වළඳ විනිස**, මැදඋයන්ගොඩ විමලකීර්ති හිමි සංස්කරණය, 1970.

**ද්විතීයික මූලාශ්‍රයඃ**
**කතිකාවත් හා භික්ෂු සමාජය**, 1985.
දඹදෙණි යුගය, දෙගම්මැද සුමනජෝති හිමි, බු. ව. 2503.
**පාලි සාහිත්‍යය**, පොල්වත්තේ බුද්ධදත්ත හිමි, 1966.
විනය කෝෂය, මොරටුවේ සාසනරතන හිමි.
සාහිත්‍ය අටුවාව - දඹදෙණි සාහිත්‍යය, සිරි තිලකසිරි.
**සිංහල විනය සාහිත්‍යය**, ඔබ්බේගොඩ ධම්මතිලක හිමි, 1922.
**සිංහල සාහිත්‍ය වංශය**, පුංචිබණ්ඩාර සන්නස්ගල, 1994.

# Vinaya (discipline) and Vinaya Sahithyaya
## (literature of discipline)

**Ven. Malwane Chandrarathne Thero**

විනය යන වචනයේ සාමාන්‍ය තේරුම හික්මීම යන්නයි. ඕනෑම සමාජයක යහපැවැත්මට හික්මීම අතිශයින්ම වැදගත් වේ. විශේෂයෙන් බුදු දහම තුළ බෞද්ධ භික්ෂූන්ගේ විනය භික්ෂු ශාසනයේ පැවැත්මට බලපාන බව පැහැදිලි කරුණකි. 'විනයෝ නාම සාසනස්ස ආයු' යන පාලි පාඨයේ තේරුම ද ශාසනයේ ආයුෂය රැඳී තිබෙන්නේ විනය මත බවයි. එයින් ගම්‍ය වන්නේ විනය පිරිහුණ දවසට ශාසනයේ පරිහානිය ද සිදුවන බවයි. ලක්දිව විනය සාහිත්‍ය පරීක්ෂා කිරීමේදී ඉතා වැදගත්ම කෘතිය වන්නේ සිඛවළඳ හා සිඛවළඳ විනිසයි. මෙය අනුරාධපුර කාලයේ අගභාගයට අයත් කෘතියකි. පාලි මූල සික්ඛාව දෙස බලා මෙය රචනා වී ඇතැයි සිතිය හැකි තරමටම ග්‍රන්ථ දෙකේම සාම්‍යතාවයක් ඇත. මහාවග්ග පාළියේ පබ්බජ්ජා ඛන්ධකය හා චුල්ලවග්ග පාළියේ වත්තක්ඛන්ධකය යන ග්‍රන්ථවලින් ද බොහෝ කරුණු ගෙන රචනා වූ හෙරණසිඛ විනිස තවත් වැදගත් කෘතියකි. සිඛවළඳ හා සිඛවළඳ විනිස පාලියට නගමින් දඹදෙණි යුගයේ රචිත සික්ඛාපද වළඤ්ජන ග්‍රන්ථය විනය පිළිබඳ ඇති වැදගත් කෘතියකි. මෙසේ විනය සාහිත්‍යයක් ගොඩනැගුණේ ශාසනයේ පවැත්ම මෙන්ම සංවර්ධනය උදෙසායි.

The entire body and multitude of 84000 profound teachings and sublime doctrine delivered by the Buddha during his successful ministry 45 years have been codified into a corpus or three baskets called (1) Basket of Discourse, (*Sutta piṭaka*) which consists chiefly of instructive and didactic discourses and conventional teachings, (2) Basket of Discipline, (*Vinaya piṭaka*) which consists of rules and regulations of the monks (*Bhikkhus*) and (3) Basket of Ultimate Doctrine (*Abhidhamma piṭaka*) which consists of

© **Senior Lecturer Ven. Malwane Chandrarathne Thero**
සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු
**මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 23 කලාපය, 2014/2015**
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය